**15-03-2020 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1985/12/11**

**සැබෑ සේවාධාරියෙකුගේ ලක්ෂණ.**

අද දින, සෙනෙහස් සාගරය වන බාප්දාදා, ඔහුගේ සියලුම ආදරණීය දරුවන්ව දකිනවා. සෑම දරුවෙක් තුළම ඔහු විශේෂතා තුනක් දකිනවා. එක් එක් දරුවා කෙතරම් ප්‍රමාණයකට විශේෂතා තුනෙන්ම පිරී සිටිනවාද? මෙම විශේෂතා තුන වන්නේ සෙනෙහස, සහයෝගය, එනම් සහජ යෝගාව සහ ශක්තියේ ප්‍රතිමූර්තියක් වීම, එනම් ගමන් කරන අතර ජීවමාන ප්‍රදීපාගාරයක්-සහ-බලාගාරයක්ය. ඔබගේ සෑම සිතිවිල්ලකින්, වචනයකින් සහ ක්‍රියාවකින් ප්‍රායෝගික ලෙසින් සියලු දෙනාම මෙම ස්වරූප තුන අත්විඳිය යුතුයි. මෙම විශේෂතා තුන ඔබට පමණක් නොව, නමුත් අන් අයටද මෙම විශේෂතා තුන අත්විඳීමට සලස්වන්න. පරම පියා සෙනෙහස් සාගරය වන සේම, මාස්ටර් සාගර ඉදිරියට පැමිණෙන දැනුම ඇති හෝ නැති ඕනෑම ජීවාත්මයක් අත්විඳිය යුත්තේ, මාස්ටර් සෙනෙහස් සාගර, ඔවුන්ට සෙනෙහස් රැලි වල අත්දැකීම ලබා දෙන බවයි. භෞතික සාගරයක, ජල සාගරයක වෙරළකට යන ඕනෑම කෙනෙක් ඉබේටම සිසිලස සහ සාමය අත්විඳින ආකාරයෙන්, ඔවුන්ද මාස්ටර් සෙනෙහස් සාගර තුළින්, තමන්ට සත්‍ය සෙනෙහස ලැබිය හැකි තැනකට ලඟා වී ඇති අන්දමින්, ඔවුන්ට ආධ්‍යාත්මික සෙනෙහසේ අත්දැකීම ලබා දෙන්න. ආධ්‍යාත්මික සෙනෙහස, වාතාවරණයේ ආධ්‍යාත්මික සුවඳ ලෙසින් අත්විඳීමට සලස්වන්න. ඔබ සියලු දෙනාම පවසන්නේ ඔබට පරම පියා කෙරෙහි සෙනෙහස ඇති බවයි, එමෙන්ම ඔහු වෙනුවෙන් ඔබ තුළ සත්‍ය සෙනෙහස තිබෙන බව පරම පියාද දන්නවා. කෙසේනමුත්, ඔබ දැන් ලෝකය තුළට සෙනෙහසේ සුගන්දය විහිදුවා හැරිය යුතුයි. ඔබ සෑම ජීවාත්මයකටම මෙම සුගන්දයේ අත්දැකීම ලබා දිය යුතුයි. සෑම ජීවාත්මයක්ම මෙසේ පැවසිය යුතුයි මේ කෙනා ශ්‍රේෂ්ඨ ජීවාත්මයක්. ආදරණීය වන්න, නමුත් පරම පියාට පමණක් නොවෙයි, සියලු දෙනාටම නිරතුරුවම ආදරණීය වන්න. සෑම කෙනෙක්ම සෑම විටම මෙම විශේෂතා දෙකම අත්විඳින විට, ඔබ මාස්ටර් සෙනෙහස් සාගරයක් බව හැඳින්වෙයි. වර්තමාන ලෝකය, සත්‍ය, ජීව අවධාන සෙනෙහස වෙනුවෙන්, සාගින්නේ පෙලෙයි. සෑම තැනකම ආත්මාර්ථකාමී සෙනෙහස දැකීමෙන් ඔවුන්ගේ හදවත් එම සෙනෙහස ඉක්මවා ගොසින්. ජීව-අවධාන සෙනෙහසේ සුළු මොහොතක අත්දැකීම වුවත් ඔවුන්ගේ ජීවිතයේ ආධාරය ලෙස, සියලු දෙනාම සලකන්නේ මේ නිසයි.

අන් අය කෙරෙහි ඇති සෙනෙහසේ විශේෂත්වය, ඔබගේ ක්‍රියා සහ සේවය තුළට දැමීමේදී, ඔබට කෙතරම් දුරට සාර්ථකත්වයක් තිබේද කියා බාප්දාදා බලමින් සිටියා. 'මා බොහෝ ආදරණීය කෙනෙක්' කියා සිතමින්, ඔබගේ මනසින්, තමන් සමඟ ඔබ සතුටින් සිටිනවා පමණක් නොවෙයි නේද? ඔබට සෙනෙහස නොතිබුණේ නම්, ඔබ පරම පියාට අයත් වන්නේ කෙසේද, එමෙන්ම ඔබ බ්‍රහ්මණ දිවියේ ඉදිරියට ගමන් කළේ කෙසේද? ඔබ තමන්ගේම මනසින් තෘප්තිමත් බවත්, බාප්දාදා දන්නවා. තමන්ට සෑහෙන තරම් ඔබට තිබෙනවා, එය හොඳයි, නමුත් ඔය සියලුම දරුවන්, පරම පියාගේ සේවාධාරීන්. පරම පියා ඔබ සියලු දෙනාව භාරකරුවන් කර, ඔය සිරුරු, මනස සහ ධනය ඔබට ලබා දී තිබෙන්නේ සේවය සඳහාය. සේවාධාරියෙකුගේ වගකීම කුමක්ද? සෑම විශේෂත්වයක්ම සේවය වෙනුවෙන් භාවිත කිරීමය. ඔබගේ විශේෂත්වය සේවය වෙනුවෙන් භාවිත නොකරන්නේ නම්, එවිට එම විශේෂත්වය වර්ධනය නොවෙයි එය තිබෙන ආකාරයෙන් පමණක්ම තිබෙයි. සමහර දරුවන් දැන් පරම පියාට අයත් බව අත්දකින නමුත්, දිනපතා පංතියට යමින්, ඔවුන්ගේ උත්සාහයන් සිදු කරමින්, සියලුම විනය නීති අනුගමනය කරන නමුත්, තිබිය යුතු තරමින් තම උත්සාහ වලින් ප්‍රගතියක් අත් දැකීමට නොහැකි වී තිබෙන්නේ මේ නිසයි. ඔවුන් ගමන් කරන නමුත් ඔවුන් වර්ධනය වන්නේ නැත. ඔවුන් තම විශේෂතා සේවය වෙනුවෙන් භාවිත නොකරයි. සේවය යනු, දැනුම ලබා දීම සහ දින හතේ පාඨමාලාව ලබා දීම පමණක් නොවෙයි. දැනුම පැවසීම, තඹ යුගය ආරම්භයේ සිටම පැවතී ඇත. කෙසේවෙතත්, මෙම බ්‍රහ්මණ උපතේ විශේෂත්වය වන්නේ යමක් පැවසීමයි, එනම් යමක් දීමය. භක්ති මාර්ගයේ පැවසීම යනු, යමක් ලබා ගැනීමයි, නමුත් මෙකල පැවසීම යනු යමක් දීමය, මන්ද ඔබ දානපතිගේ දරුවන්ය ඔබ සාගරයේ දරුවන්ය. ඔබ සමඟ සබඳතාවයකට පැමිණෙන ඕනෑම කෙනෙක් යමක් ලබාගෙන ආපසු යාම අත්විඳිය යුතුයි, ඔවුන් යමක් ඇසීමෙන් පසුව පමණක් ආපසු යෑම නොවෙයි. ඔවුන් ආපසු යන්නේ දැනුම සමඟයි, සෙනෙහසේ ධනය, සිහිපත් කිරීමේ බලයේ ධනය, ශක්තීන්ගේ ධනය සහ සහයෝගයේ ධනය ඇතිවයි, එනම්, ඔවුන් ආපසු යන්නේ තම දෑත්, එනම් ඔවුන්ගේ බුද්ධි මේ දේ වලින් පුරවා ගෙනයි. මෙය

සත්‍ය සේවය ලෙස හැඳින්වෙයි. තත්පරයක දෘෂ්ටියෙන්, වචන කිහිපයකින්, ඔබගේ බලවත් ආකල්පයේ සහ සබැඳියාවේ බලවත් චිත්ත තරංග තුළින්, ඔබට තිබෙන්නේ දානපතියෙක් වී, ලබා දීම පමණයි. එවන් සේවාධාරීන් සැබෑ සේවාධාරීන්ය. මේ ආකාරයෙන් ලබා දෙන අය, නිරන්තරයෙන් සෑම මොහොතකම වර්ධනය අත්දකියි, ඔවුන් සෑම මොහොතකම ප්‍රගතියක් ලබන බව අත්දකියි. එසේ නැත්නම්, ඔබ පසුපසට යන බව ඔබට නොහැඟුනත්, ඔබ කළ යුතු තරමින් ඉදිරියට ගමන් කරන්නේද නැත. එබැවින් දානපතියන් වී අත්දැකීමක් ලබා දෙන්න. ඒ ආකාරයෙන්ම ඔබ සහයෝගී සහ සහජ යෝගීන් වන්නේ තමන් වෙනුවෙන් පමණක්ද? ඔබගේ උනන්දුව, උද්යෝගය සහ සහයෝගයේ රැලි, අන් අයවත් සහයෝගී කරවිය යුතුයි. ඔබගේ සහයෝගයේ විශේෂත්වයෙන්, සියලුම ජීවාත්ම අත්විඳිය යුත්තේ, ඔබ ඔවුන්ට උපකාර කරන බවයි ඔවුන්ට දුර්වල ස්ථිතියක් ඇතිවන ඕනෑම විටෙක හෝ යම් අහිතකර අවස්ථාවක සිටින විට, ඔවුන්ව ඉදිරියට ගමන් කරවීමට මඟ පාදන්නේ ඔබලා පමණක් බව, ඔවුන්ට අත්දැකීමට සලස්වන්න. ඔය ජීවාත්මයන්ට එම සහයෝගී බවේ විශේෂත්වය තිබෙන බව, සියලුම ජීවාත්ම අත්විඳිය යුතුයි. සේවය වෙනුවෙන් තම විශේෂත්වය භාවිත කිරීම ලෙස මෙය හැඳින්වෙයි. ඔබ පරම පියා සමඟ සහයෝගී වන නමුත්, පරම පියා ලෝකය සමඟ සහයෝගීය. සියලුම දරුවන් පිළිබඳව මෙම අත්දැකීමේ වදන් මතු විය යුතුයි, පරම පියා මෙන් මේ කෙනාද සියලු දෙනා සමඟ සහයෝගි බව. පෞද්ගලිකව එක්කෙනෙක් හෝ දෙදෙනෙක් සමඟ පමණක් සහයෝගී නොවන්න. එය ආත්මාර්ථකාමී ලෙස සහයෝගී වීමය. එය සීමිත අන්දමකින් සහයෝගී වීම වෙයි. සැබෑ, සහයෝගී ජීවාත්ම, අසීමිත ආකාරයකින් සහයෝගී වෙයි. ඔය සියලු දෙනාගේ නම්බු නාමය කුමක්ද? ඔබ ලොවට සෙත සලසන්නන්ද නැත්නම් ඔබගේ මධ්‍යස්ථානයට පමණක් සෙත සලසන්නන්ද? ඔබ, ඔබගේ රටට සෙත සලසන්නන්ද නැත්නම් ඔබගේ පංතියේ ශිෂ්‍යයන්ට පමණක් සෙත සලසන්නන්ද? ඔබට එවන් නම්බු නාමයක් නැහැ නේද? ඔය ලොවට සෙත සලසන අය, ලෝකයේ පාලකයන් වීමට යනවාද, නැත්නම් ඔබගේ මාලිගාවල පමණක් පාලකයන් වීමට යනවාද? තම මධ්‍යස්ථානයේ සීමාව තුළ පමණක් සිටින කෙනෙක්, තමන්ගේ මාලිගාවේ පමණක් පාලකයෙක් වෙයි. කෙසේ වුවද, ඔබට දැන් සීමිත උරුමයක් නොව, අසීමිත පරම පියාගෙන් අසීමිත උරුමය හිමි වනවා. එබැවින් සහයෝගිතාවයේ විශේෂත්වය, සියලු දෙනටම භාවිත කිරීම යනු, සහයෝගී ජීවාත්මයක් වීමය. මෙම ක්‍රමවේදයෙන්, බලවත් ජීවාත්මයක්, සියලු බලයන්, තමන්ට පමණක් නොව, සේවයේදී සියලු දෙනාටම භාවිත කරයි. කෙනෙකුට දරා ගැනීමේ බලය නොමැති නමුත් ඔබට එය තිබෙන්නේ නම්, එවිට එම කෙනාට මෙම බලය දීම, එය සේවය වෙනුවෙන් භාවිත කිරීම ලෙස හැඳින්වෙයි. මෙසේ නොසිතන්න මට දරාගැනීම තිබේ. කෙසේවෙතත්, ඔබගේ දරාගැනීමේ ගුණදහමේ ආලෝකය සහ බලය, අන් අයටත් ලඟා විය යුතුයි. ප්‍රදීපාගාරයක ආලෝකය තිබෙන්නේ තමන්ට පමණක් නොවෙයි. එය තිබෙන්නේ, අන් අයටත් ආලෝකය ලබා දී, ඔවුන්ට මාර්ගය පෙන්වීම සඳහාය. එවන් බලයේ ස්වරූපයක් වන්න, එනම්, ප්‍රදීපාගාරයක් සහ බලාගාරයක් වී, අන් අයට එහි යහපතේ අත්දැකීම ලබා දෙන්න. දුර්වලතාවයේ අන්ධකාරයේ සිට, තමන් ආලෝකයේ ශක්තිය කරා පැමිණීමේ අත්දැකීම ලබා දෙන්න. ඔවුන්ට මෙසේ දැනෙන්නට සලස්වන්න තම බලයෙන්, මෙම ජීවාත්මය මට බලවත් වීමට උපකාර කරයි, එනම් ඔබ උපකරණයක් වීමෙන්ම පමණක්, එම ජීවාත්මයට පරම පියා සමඟ සම්බන්ධතාවයක් ඇති කිරීමට ඔබ මඟ පාදයි. ඔබ කෙනෙකුට සහයෝගය ලබා දී, එම කෙනාව තමන් තුළ සිර කිරීම සිදුනොකළ යුතුයි. එවන් ජීවාත්ම, සේවය වෙනුවෙන් තම විශේෂත්ව භාවිත කරන්නේ, ඔවුන් අන් අයට පරම පියාගේ තිළිණය ලබා දෙන බවට අවධානය සහ බලය ඇතිවයි. සැබෑ සේවාධාරීන්ගේ ලක්ෂණ වන්නේ, ඔවුන්ගේ සෑම ක්‍රියාවක් තුළින්ම පරම පියා දිස්වීමයි. ඔවුන්ගේ සෑම වදනක්ම අන් අයට පරම පියාව සිහි කරදෙයි. ඔවුන්ගේ සෑම විශේෂත්වයක්ම දානපති වෙතට ඔවුන්ව යොමු කිරීමේ සංඥාවක් විය යුතුයි. මිනිසුන් නිරතුරුවම පරම පියාව පමණක් දකීවි. ඔවුන් ඔබව නොදකියි, නමුත් සෑම විටම පරම පියාව දකියි. ඔබ සැබෑ සේවාධාරියෙක් වීමේ සලකුණ වන්නේ කෙනෙක් ඔබ සමඟ සහයෝගී වීම නොවෙයි. ඔබගේ විශේෂත්වය නිසා කෙනෙක් ඔබ සමඟ බොහෝ සහයෝගී වන බවට කුඩා සිතිවිල්ලක් පවා කිසි විටෙක ඇති කර නොගන්න. සහයෝගී ජීවාත්මයකට සහයෝගය ලබා දීම ඔබගේ යුතුකමයි. ඔවුන් දකින්නේ, පරම පියාව නොව ඔබව නම්, එය සේවය නොවෙයි, එය තඹ යුගයේ ගුරුන් කරන ආකාරයට ජීවාත්මයන්ව පරම පියාගෙන් ඉවතට හැරවීමයි. ඔබ ඔවුන්ට පරම පියාව අමතක කරවූවා, එමෙන්ම ඔබ සේවයක් කළේ නැත. එය, ජීවාත්මයන්ව වැට්ටීමයි, ඔවුන්ව ඉහළ නැංවීම නොවෙයි. එය පුණ්‍ය කර්මයක් නොව, පාපයකි, මන්ද, පරම පියා නොමැති විට, පාපය තිබේ. එබැවින් සත්‍ය සේවාධාරීන්, ජීවාත්මයන්ට, සත්‍යය සමඟ සම්බන්ධතාවයක් ඇති කිරීමට මඟ පාදයි.

ඇතැම් විට බාප්දාදාට ඔය දරුවන් ගැන හාස්‍යයක් ඇති වෙයි, ඔබගේ අරමුණ සහ එම අරමුණ වෙනුවෙන් ඔබට තිබෙන සුදුසුකම් පිළිබඳව. ඔබ කළ යුත්තේ ජීවාත්මයන්ව පරම පියා වෙතට ලඟා වීමට සැලැස්වීමයි, නමුත් ඒ වෙනුවට, ඔබ කරන්නේ ඔවුන්ව ඔබ වෙතට ලඟා කරවීමයි. ඔබ අනෙක් දිව්‍යමය පියවරුන් ගැන පවසන්නේ, ඔවුන් ජීවාත්මයන්ව උඩ සිට පහළට ගෙන එන නමුත් ඔවුන් ජීවයන්ව ඉහළට රැගෙන නොයන බවයි. දිව්‍යමය පියවරු නොවන්න. ඇතැම් විට සමහර අවස්ථාවන්හි, ඔය ජීවාත්ම ඍජු මාවතක් ගැනීම වෙනුවට ඔබ විටෙක පැති මාවත් වල සිරවෙන බව බාප්දාදා දුටුවා. ඔබගේ මාවත වෙනස් වෙයි. මේ නිසයි, ඔබ නොකඩවා ගමන් කරන නමුත්, ඔබගේ ගමනාන්තයට ඔබ සමීප නොවන්නේ. එබැවින් සත්‍ය සේවාධාරියෙක් යනු කවරෙක්ද කියා ඔබට වැටහෙනවාද? අසීමිත දැක්මක් සහ අසීමිත ආකල්පයකින් මෙම විශේෂතා තුනම සේවය වෙනුවෙන් භාවිත කරන්න. අච්ඡා.

දානපතියාගේ දරුවන් වන, නිරන්තර දානපතියන්ට, සියලු දෙනාව පිරිපුන් බවට පත් කරවන අයට, සියලු සම්පත් සේවය වෙනුවෙන් භාවිත කර ඒ අනුව ප්‍රගතියක් ලබන අයට, සෑම දෙයක්ම පරමාත්ම දෙවියන්ගෙන් ලැබූ තිළිණයක් බව සලකා, පරමාත්ම දෙවියන්ගේ පූජනීය පිදුම අන් අයට ලබා දෙන අයට, නිරන්තරයෙන් ඒකායන කෙනා වෙතට සංඥා කර, අන් අයව නිරන්තර බවට පත් කරන අයට, සියලු දෙනා සමඟ සෑම විටම සහයෝගී වන සත්‍ය සේවාධාරීන්ට, බාප්දාදාගේ සෙනෙහස, සිහි කිරීම සහ නමස්කාරය.

**බාප්දාදා කණ්ඩායම් මුණගැසෙමින් - කුමාරීන්**

මෙම සේනාව කරන්නේ කුමක්ද? සේනාවක් සෑම විටම ජය ලබයි. සේනාවක් තිබෙන්නේ ජයග්‍රහණය කිරීමටයි. සේනාවක් තිබෙන්නේ සතුරා සමඟ සටන් කිරීමටයි. එබැවින් ඔබ සියලු දෙනාගේ කාර්යය වන්නේ, සතුරා වන මායා පරාජය කිරීමයි. සෑම විටම ඔබගේ මෙම කාර්යය දැන, ඔබට හැකි තරම් වේගයෙන් අඛණ්ඩව ඉදිරියට යන්න, මන්ද කාලය ඉතා සීඝ්‍රයෙන් ඉදිරියට ගමන් කරනවා. කාලයේ වේගය වැඩි වන අතර ඔබගේ වේගය අඩු නම්, ඔබ නිසි කලට ලඟා නොවෙයි. එබැවින් වේගවත් වන්න! සෙමින් යන අය දඩයම බවට පත් වෙයි. ශක්තිමත් අය, සෑම විටම ජයගනී. එසේ නම් ඔබ සියලු දෙනාම ජයග්‍රාහී අයද?

සෑම විටම සේවය කළ හැකි අය වීමේ අරමුණ තබාගෙන නොකඩවා සේවයේ ඉදිරියට යන්න, මන්ද කුමාරීන්ට කිසිදු බන්දනයක් නොමැත. ඔබට අවශ්‍ය තරම් සේවය කළ හැක. ඔබ පරම පියාට අයත් බවත් ඔබ පරම පියා වෙනුවෙන් සිටින බවත් සලකමින් සෑම විටම නොකඩවා ඉදිරියට ගමන් කරන්න. සේවය සඳහා උපකරණ වන අය ඉබේටම සතුට සහ බලය ලබයි. සේවයේ භාග්‍යය ලැබෙන්නේ කෝටි ගණනකින් අතලොස්සකට පමණයි. කුමාරීන් සෑම විටම පිදුම්-ලබන්නට-සුදුසු ජීවාත්මයි. ඔබගේ පිදුම්-ලබන්නට-සුදුසු ස්වරූපය තම අවධානයේ තබාගෙන සෑම ක්‍රියාවක්ම සිදුකරන්න, එමෙන්ම ඕනෑම ක්‍රියාවක් කිරීමට පෙර, එම ක්‍රියාව, පිදුම්-ලබන්නට-සුදුසු ජීවාත්මයකට සුදුසු ක්‍රියාවක්ද කියා පරීක්ෂා කර බලන්න. එය එසේ නොවේ නම් එය වෙනස් කරන්න. පිදුම්-ලබන්නට-සුදුසු ජීවාත්ම කිසිම විටෙක සාමාන්‍ය නැත ඔවුන් ශ්‍රේෂ්ඨයි. එක කුමාරියක්, බ්‍රහ්මණයන් 100 දෙනෙකුට වඩා ශ්‍රේෂ්ඨයි. එබැවින් ඔය සෑම කුමාරි කෙනෙක්ම බ්‍රහ්මණයන් 100 දෙනෙක් සූදානම් කළ යුතුයි. ඔබ ඔවුන්ට සේවය කළ යුතුයි. ඔය කුමාරීන් සිතා ඇති විශ්මය ජනක සැලසුම් මොනවාද? ජීවාත්මයකට යහපතක් සැලසීමට වඩා ශ්‍රේෂ්ඨ වන්නේ කුමක්ද? ඔබ සෑම විටම තනිවම සතුට අත්විඳින අය නේද? ඇතැම් විට ඔබට දැනුමේ සතුට තිබේ, ඇතැම් විට සිහි කිරීමේ සතුට, ඇතැම් විට සෙනෙහසේ සතුට. තිබෙන්නේ සතුට සහ වඩාත් සතුටම පමණයි. සංගම යුගය සතුටේ යුගයයි. අච්ඡා.

බාප්දාදාගේ දෘෂ්ඨිය නිරන්තරයෙන් තිබෙන්නේ කුමාරීන් මතයි. කුමාරීන් තමන්ව පත් කරගන්නේ කවුරුන් බවටද යන්න, රඳා පවතින්නේ ඔවුන් මතයි, නමුත් බාප්දාදා පැමිණ ඇත්තේ ඔබ සියලු දෙනාව ලෝකයේ අධිපතියන් කරවීමටයි. සෑම විටම ලෝකයේ අධිපතියෙක් වීමේ සතුට සහ කුල්මත් බව පවත්වාගන්න. සෑම විටම වෙහෙස නොබලා සේවයේ ඉදිරියට ගමන් කරන්න. අච්ඡා.

**වරදානය:** ඔබ කරන්හාර් (කරන කෙනා) සහ කරවන්හාර් (දිරි ගන්වන කෙනා) වීමේ අවධානය තිබීම තුළින්, ආලෝකමත් කිරුළක් පැළඳ සිටිත්වා.

මා උපකරණයක්, කර්ම යෝගියෙක්, කරන්හාර් (කරන කෙනා) වන අතර පරම පියා කරවන්හාර් (දිරි ගන්වන කෙනාය). ඔබට මෙම ස්වභාවික අවධානය තිබෙන්නේ නම්, ඔබට

නිරන්තරයෙන් ආලෝකමත් කිරුළක් තිබී, සැහැල්ලු අධිරාජවරයෙක් වෙයි. පරම පියා සහ මා පමණයි, තුන්වැන්නෙක් නැත මෙය අත්විඳීමෙන් ඔබ පහසුවෙන් සැහැල්ලු අධිරාජයෙක් වෙයි. එවන් අධිරාජවරු වන අය, මායා ජයගන්නන්, තම භෞතික ඉන්ද්‍රියන් ජයගන්නන් සහ පදාර්ථ ජය ගන්නා අය වෙයි. කෙසේවෙතත්, වැරදීමකින් හෝ කෙනෙක් නිෂ්ඵල හැඟීම් සහ චේතනාවන්ගේ බරක් තමන් මත පටවන්නේ නම්, එවිට කිරුළක් වෙනුවට, ඔහුගේ හිස මත කණස්සල්ලේ වට්ටි බොහොමයක් තිබෙයි.

**පාඨය:** සියලු බන්දන වලින් නිදහස් වීම සඳහා, සියලු ශාරීරික සම්බන්ධතා කෙරෙහි බැඳීම් විනාශ කරන්නෙක් වන්න.

***** ඕම ශාන්ති *****